# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2021.09.15

වර්ෂ 2021 ක් වූ සැප්තැම්බර් මස 15 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ සැප්තැම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**<u>මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු</u>**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
10. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
11. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
12. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u> ඃ- නැත**

2021-08-18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඉදිරි මහා සභා රැස්වීමේදී සභා සම්මත කිරීමට ඉදිරිපත් කරන බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>**

මාසයකට එක් මහා සභා රැස්වීමක් අනිවාර්යයෙන් පැවැත්වීමට නියමිත බැවින් කොරෝනා වෛරසය ව්‍යාප්තිය හමුවේ රටේ ඇඳිරි නීතිය පනවා ඇති නමුත් අද දිනයේ මහා සභා රැස්වීම පැවැත්වීමට තීරණය කළ බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**<u>(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u> ඃ- නැත**

**<u>(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත**

<u>(ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය, ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා, ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සහ ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)</u>

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**01.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ දැනට සේවය කරනු ලබන කළමනාකරණ අධි ශ්‍රේණියේ නිලධාරියෙකු වන ලමාහේවගේ අනිල් රංජන් මහතා වයස අවුරුදු හැට සම්පූර්ණවීම හේතුවෙන් 2021-11-23 දින විශ්‍රාම යාමට නියමිතය. මෙම නිලධාරියා විශ්‍රාම ගැන්වීම පිළිබඳ අදාළ බලධාරීන් වෙත දන්වා ඇතත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් වන මෙම තනතුර සඳහා නිලධාරියෙකු පත්කිරීමට මෙතෙක් අදාළ පත්වීම් බලධාරීන් කටයුතු කර නොමැති බැවින් ප්‍රාදේශීය සභාවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ජ්‍යෙෂ්ඨ සහ පළපුරුදු නිලධාරියෙකුගේ අවශ්‍යතාවය ඇත. මෙම තනතුරේ වැඩ බැලීම සඳහා පත්කිරීමට ජ්‍යෙෂ්ඨ සහ පළපුරුදු නිලධාරියෙකු නොමැති බැවින් දැනට ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුරේ

සේවය කරනු ලබන ලමාහේවගේ අනිල් රංජන් මහතා වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට කටයුතු කරන ලෙස අදාළ පත්වීම් බලධාරීන් දැනුවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු කාරණා ගැන සභාව දැනුවත් කරන ලදී.

මෙම යෝජනාව පිළිබඳව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් අදහස් දැක්වීමෙන් අනතුරුව විරෝධය පළකර සිටින ලදී.

ඒ අනුව ඉහත යෝජනාව සභා සම්මත කිරීම සඳහා ඡන්ද විමසීමක් සිදුකළ අතර ඡන්ද විමසීමේ ප්‍රතිඵලය පහත පරිදි වේ.

පක්ෂව - 14

විපක්ෂව - 02

**ඉහත යෝජනාව සභා සම්මත කිරීම සඳහා ඡන්ද විමසීමේදී පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
07. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
08. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
09. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
10. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
11. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
12. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
13. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
14. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා

**ඉහත යෝජනාව සභා සම්මත කිරීම සඳහා ඡන්ද විමසීමේදී විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

එම යෝජනාව වැඩි ඡන්ද 12කින් සභා සම්මත වී ඇති බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

<u>(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)</u>

**02.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව විසින් සිට්ටුස්වත්තේ ඉදිකිරීමට යෝජිත ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීමට සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා පත්කර ගැනීම සඳහා නැවත ටෙන්ඩර් කිරීමට 2021-05-19 දින ඉ.01 අංකය යටතේ ලබා ගත් සභා තීරණය වාර්තා කිරීම අපැහැදිළි බැවින් යෝජිත ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීම සඳහා නර්ඩ් ආයතනයේ ඇස්තමේන්තුව අනුව නැවත කැඳවන ලද ටෙන්ඩරය අනුව ලැබෙන ටෙන්ඩර්පත් අතරින් සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා පත්කර ගැනීම සඳහා යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු කාරණා ගැන සභාව දැනුවත් කරන ලදී.

(ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

මෙම යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා හට ඇති අපහැදිලිතාවයන් ඉදිරිපත් කළ අතර ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් එම ගැටළු පැහැදිළි කරන ලදී.

ඉන් අනතුරුව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් මෙම යෝජනාව සම්බන්ධව සිය අදහස ප්‍රකාශ කරන ලදී.

තවලම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ අළුත්වැඩියාවන් පිළිබඳව සහ එම ආදාහනාගාරය ඉදිකරන ලද ආයතනය සිදුකරනු ලබන සේවාවන් සම්බන්ධව තවලම ප්‍රාදේශීය සභාව මුහුණ පා ඇති ගැටළු පිළිබඳව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

සිට්ට්‍රස් වත්තේ අදාහනාගාරය ඉදිකිරීම පිළිබඳව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සිය අදහස් දැක්වීම සිදුකරන ලදී. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා මතු කරන ලද අදහස්වලට ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා විරෝධය පළ කරන ලදී. එම අවස්ථාවේදී ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමාගේ අදහස් දැක්වීමට විරෝධය පළ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** කලේගාන පොළ භූමියේ ඇති පැරණි ගොඩනැගිල්ල මිල ගණන් කැඳවා කඩා ඉවත් කිරීමට 2021-08-18 දින පැවති මහා සභා රැස්වීමේදී තීරණය කළ නමුත් ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් නොවූ බැවින් සභාවේ සේවකයන් සහ වාහන උපයෝගී කර ගනිමින් අදාළ ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමාගේ යෝජනා**

**04.** වෙළඳපොලේ ඇති ලිට්රෝ ගෑස් සිලින්ඩරය සම්බන්ධයෙන් ජනතාව වෙත මතු වී ඇති ගැටළුව නිරාකරණය කිරීමට ගෑස් සිලින්ඩරයේ ප්‍රමාණය සහතික කර වෙළඳපොලට ඉදිරිපත් කරන ලෙස පාරිභෝගික සේවා අධිකාරියට දන්වා යවන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු යෝජනාවට අදාළ ගැටළුව දැනට වෙළඳපොළ තුළ නැති බවට ප්‍රකාශ කරන ලදී.

එම නිසා ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමාගේ ඊළඟ යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඉහත යෝජනාව ස්ථිර කිරීමක් සිදු නොවූ බැවින් සභා සම්මතවීම සිදු නොවීය.

**05.** සේනානායක මාවතේ සිට කපුහෙම්පල මාර්ගයේ ඇල්හේන වත්ත හරහා වැටෙන අතුරු මාර්ගය දෙපස මායිම් පෙනෙන ලෙස සකස්කර කොන්ක්‍රීට් කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු කාරණා ගැන සභාව දැනුවත් කරන ලදී.

ඉන් අනතුරුව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ඉහත යෝජනාවට අදාළ මාර්ගයේ මායිම් සම්බන්ධව ඇති ගැටළු සහ මාර්ගය දෙපස කුණු දැමීම සම්බන්ධව ඇති ගැටළු පිළිබඳව අදහස් දක්වන ලදී.

ඉහත යෝජනාවට අදාළ මාර්ගයේ දෙපස කුණු දැමීම තහනම් යනුවෙන් පුවරු සවි කිරීමටත්, දැනට ඇති කුණු සභාවේ ජේ.සී.බී යන්ත්‍රය උපයෝගී කර ගනිමින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් දැනුම් දෙන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**06.** තොටගොඩ, පියසේන සර්විස් සෙන්ටර් එකෙන් ඉවතලන කළු තෙල් තොටගොඩ වේල්ලට මුසුවන බැවින් ඒ සම්බන්ධයෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් මෙම යෝජනාවට අදාළ ආයතනය මගින් යෝජනාවේ සඳහන් ආකාරයේ පරිසර දූෂණයක් සිදු නොවන බවට සභාව දැනුවත් කරන ලදී.

මෙම යෝජනාවට අදාළ ගැටළුව සම්බන්ධව සභාවේ පරිසර නිලධාරි ලවා පරීක්ෂණයක් සිදුකරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ඉහත යෝජනාව ස්ථිර කිරීමක් සිදු නොවූ බැවින් සභා සම්මතවීම සිදු නොවීය.

**<u>ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමාගේ යෝජනා</u>**

**07.** මුලන ජනපදයේ පොදු සුසාන භූමිය ප්‍රතිසංස්කරණය කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**08.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ දුරකථන නාමාවලියක් ලබා දෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම දුරකථන නාමාවලිය ලැබුණ බවත් ඒ සම්බන්ධයෙන් ස්තූතිය ප්‍රකාශ කරන බවත් ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>**

**09.** හිරිඹුර, ගැමුණු මාර්ගයට සහ චන්ද්‍රසිරි මහතාගේ නිවස අවට නිවාස වලට හානිදායක අයුරින් පවතින අනතුරුදායක අඹ ගස සහා අරමුදලින් කපා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු කාරණා ගැන සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**10.** ගොඩකන්ද, පරණ ගෙදරවත්ත ඉඩම කරාපිටියේ පරිසර සංවිධානයට හා ග්‍රාමක අපි නිදහස් මිතුරු සංවිධානයට කොම්පෝස්ට් පොහොර නිපදවීම සඳහා පරිහරණය කිරීමට ලබාදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු කාරණා ගැන සහ මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ආකාරය සම්බන්ධව සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**11.** කොරෝනා රෝගීන් රෝහල් ගත කිරීම සහ පී.සී.ආර් පරීක්ෂණ සඳහා රැගෙන යාමේදී දැඩි අපහසුතාවයට පත්වන බැවින් ඒ සඳහා සභාව සතු වාහනයක් හෝ කුලී පදනම මත ලබාගත් වාහනයක් ආරක්ෂිතව සකසා යෙදවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමේ අරමුණු සම්බන්ධව සභාව දැනුවත් කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමේ හැකියාව සම්බන්ධ නෛතික පසුබිමට අදාළ කරුණු කාරණා ගැන සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**12.** නරාවල, කාසල්හිල්වත්ත ගම්මානයේ කනත්ත දෙසට ඇති මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීමට නියමිත බැවින් එම මාර්ගය සභාවේ තාක්ෂණ නිලධාරීගේ අධීක්ෂණය යටතේ නියමිත පළලට පළල්කිරීම සඳහා සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදවන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු කාරණා ගැන සභාව දැනුවත් කරන ලදී.

යෝජනාවට අදාළ මාර්ගය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදා ගනිමින් පළල් කිරීමට ඇති ප්‍රායෝගික බාධාවන් පිළිබඳවත් සභාවේ තාක්ෂණ නිලධාරිගේ සහ මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරිගේ අධීක්ෂණය යටතේ අදාළ මාර්ගය පළල් කිරීම සුදුසු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

යෝජනාවට අදාළ මාර්ගයේ මැනුම් කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මැදිහත්වීම අනුව සිදුකර ඇති බවත්, අදාළ මාර්ගයේ සංවර්ධන කටයුතු සිදු කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කිරීමට සූදානම් වන බැවින් ඊට ප්‍රථම මාර්ගය පළල් කර ගැනීමේ කටයුත්ත සිදුකිරීමේ අවශ්‍යතාවය ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

අදාළ මාර්ගය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන පළල් කිරීමේදී ඇතිවන බාධාවන් අවම කර ගැනීම සඳහා පොලීසියේ සහයෝගය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා ඃ- නැත</u>**

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u>**

**<u>01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

2021 වර්ෂයේ අගෝස්තු මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

2021 වර්ෂයේ අගෝස්තු මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව</u>**

2021 වර්ෂයේ අගෝස්තු මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාව කල්තබන ලදී.)**

**<u>04. වෙනත් ලේඛන</u> ඃ- නැත**

**<u>(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා</u>**

**<u>පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය</u>**

**<u>2021 වර්ෂයේ සැප්තැම්බර් මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.</u>**

ප්‍රායෝගිකව පැන නගින ගැටළු නිසා ඉදිරියේදී මහා සභා රැස්වීමේදී ප්‍රගතිය ගැන සමාලෝචනය සිදු නොකිරීමටත්, සභිකවරුන්ගේ සහ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මාසිකව ප්‍රගති සමාලෝචන රැස්වීමක් පැවැත්වීමට කටයුතු කරන බවටත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගැටළුවක්ව පැවති වක්වැල්ල ප්‍රදේශයේ වීදි පහන් සඳහා කණුවෙන් කණුවට තනි ස්වීච් ලබා දීම සම්බන්ධව ස්තූතිය පළ කරන ලද ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් සේරියගොඩ පාරට පිවිසුම් ස්ථානයට සහ ආරච්චි කන්දේ පීල්ල අසළ ප්‍රදේශයට අධිබල වීදි පහන් සවි කරන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී. ස්වීච් ක්‍රියාත්මක නොවන වීදි පහන් පිළිබඳව ඉදිරියේදී සභාව දැනුවත් කරන බවට ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් සභාවට ප්‍රකාශ කරන ලදී.

දිවා කාලයේදී දැල්වෙන වීදි පහන් නොදන්වා ඉවත් කරන ලෙසත්, දක්ෂිණාපාය අමාත්‍යාංශය ඉදිරිපිට ඇති වීදි පහන ඒ සඳහා උදාහරණයක් බවටත් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කපුහෙම්පල සායන ගොඩනැගිල්ලේ උඩුමහල සඳහා විදුලිය ලබා ගැනීම සඳහා යෝජනා කළ බවත් එය තවම ඉටු වී නැති බැවින් එම කාර්යය කඩිනමින් ඉටුකර දෙන ලෙසත් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

ගිංතොට තුනී ලෑලි සංස්ථාවට අයත්ව තිබූ භූමිය සභාවට අත්පත්කර ගැනීමට අදාළව සකස්කරන ලද ව්‍යාපෘති වාර්තාව කඩිනමින් ජනාධිපති ලේකම් කාර්යාලයට යොමුකරන ලෙස ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

වැලිකැටිය වත්ත මාර්ගයේ පැති බැම්ම ඉදිකරදෙන ලෙස ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

මහවත්ත මාර්ගය ප්‍රවේශයේ ඇති අනවසර ගොඩනැගිල්ල ඉවත් කිරීමට අවශ්‍ය නීතිමය පියවර කඩිනමින් ගන්නා ලෙසත් බල ප්‍රදේශයේ කොම්පෝස්ට් බඳුන්වල අවශ්‍යතාවය ඇති ජනතාව වෙත කොම්පෝස්ට් බඳුන් සහන මිලට ලබා දීම සඳහා වූ ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කරන ලෙස ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

<u>(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)</u>

කරාපිටිය, මොඩර්න් හාඩ්වෙයාර් එක අසළ කාණුව සංවර්ධනය කර දෙන ලෙස ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

ප්‍රධාන සංවර්ධන යෝජනා දෙකක් ක්‍රියාත්මක වන බැවින් ඉදිරියේදී සභා අරමුදල් මගින් ඉටුකරන සංවර්ධන කටයුතු සීමා කිරීමට සිදුවන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මහා සභා රැස්වීම් කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා විමර්ශන නිලධාරිව සහභාගි කර ගන්නා ලෙසත්, සභා යෝජනා සම්බන්ධව ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව අදාළ යෝජනාවන් ඉදිරිපත් කරන ලද මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන ලෙසත් ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය හට අද දිනයේ මහා සභා රැස්වීමට සහභාගිවීමට හැකියාවක් නොමැති බවට දැනුම් දුන් බැවින් එතුමිය සඳහා නිවාඩු අනුමත කරන ලෙස ගරු සභාපති

දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

සභා යෝජනාවල ප්‍රගතිය පිළිබඳව අධීක්ෂණයට වෙනම නිලධාරියෙකු පත්කර ඇති බවත්, ඉදිරියේදී මාසිකව ප්‍රගතිය සමාලෝචන රැස්වීමක් කැඳවීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කඳු සහිත වෙන්දේසි ඉඩම්වල නිවාස ඉදිකිරීමේදී එන්.බී.ආර්.ඕ වාර්තා ලබා ගැනීමේදී ඇතිවන අඩුපාඩු ගැන සභාව දැනුවත් කළ ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් අනවසර ඉදිකිරීම් සම්බන්ධ නඩුවල විස්තර සභාව දැනුවත් කරන ලෙසත්, වෙන්දේසි ඉඩම්වලට සභාවෙන් අනුමැතිය දෙනතුරු ඉඩම් මිලදී ගැනීමෙන් වලකින ලෙස බැනර් ප්‍රදර්ශනය කරන ලෙසත් ඉල්ලීම් කරන ලදී.

පෝද්දල, නරාවල, සිට්ට්‍රස් හන්දිය, සඳකැලුම් ලිපිනයේ පදිංචි බී.ජී. ලලිත් පුෂ්පකුමාර මයා ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධීකරණ නිලධාරි ලෙස මෙම මාසයේ සිට කටයුතු කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

<u>(ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)</u>

අඩු ප්‍රතිලාභීන් සහිත සහ ප්‍රතිලාභ නොලබන ප්‍රදේශවල මුල් ළමාවිය සංවර්ධන කටයුතු සඳහා පෙර පාසල් ස්ථාපිත කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක බවත්, ඒ සඳහා එස්.ඕ.එස්. ළමා ගම්මානය අසළ ඇති සභාව සතු ඉඩමේ පෙර පාසලක් ඉදිකිරීම සුදුසු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සභාව මගින් පෙර පාසල් පවත්වාගෙන යනු නොලබන වෙනත් දුරස්ථ ප්‍රදේශයකට එම අවස්ථාව ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

ගාල්ල, ලබුදූව, පහළවත්ත, අංක 46 ලිපිනයේ පදිංචි එන්.ටී. සංතෝෂනි මහත්මිය විසින් පහත්බිමක් ගොඩකිරීම සහ කාණුවක් ඉදිකිරීම සම්බන්ධව යොමුකරන ලද ලිපිය ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාගත කරන ලද අතර ඒ පිළිබඳව පරීක්ෂා කිරීමෙන් පසු අදාළ ආයතන දැනුවත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

හෝළුවාගොඩ සංවර්ධන ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘති වාර්තාව සභාගත කරන ලෙස කරන ලද යෝජනාව අනුව අදාළ ආයතන දැනුවත් කළ බවට දැන්වූ බවත්, නමුත් ඉන් පසුව ඒ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් නොවූ බව ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

<u>(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)</u>

පෝද්දල, මීපාවල, ලිපිනයේ පදිංචි එච්.ජී. අනුලාවතී මහත්මිය විසින් හෝළුවාගොඩ සංවර්ධන ව්‍යාපෘතියට ඉඩම් පවරා ගැනීමට අදාළව ඉදිරිපත් කරන ලද අභියාචනය ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභාගත කරන ලද අතර මේ සඳහා සාධාරණයක් අදාළ මහත්මිය වෙත ලබා දීමට මැදිහත්වන ලෙස ඉල්ලා සිටින ලදී.

හෝළුවාගොඩ සංවර්ධන ව්‍යාපෘතිය මගින් ඉදිකරනු ලබන කඩ කාමර වලින් එක් කඩ කාමරයක් සභාවේ එකඟතාවය ඇතුව එම මහත්මිය හට ලබාදීමට හැකියාව ඇති බවත්, එසේ නැතහොත් ඉඩම් පවරා ගැනීම වෙනුවෙන් ගෙවනු ලබන වන්දි මුදල් වලින් වෙනත් ස්ථානයක් මිලදී ගත් පසු දැනට පවතින කඩකාමරයේ ගලවා ඉවත් කරන ලද ද්‍රව්‍ය වලින් කඩ කමාරය ස්ථාපිත කර ගැනීමට සහයෝගය ලබාදිය හැකි බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. නමුත් එම මහත්මිය විසින් ප්‍රධාන මාර්ගයක් ආසන්නයේ පර්චස් පහක පමණ බිම් කඩක් ලබාදෙන ලෙස කරනු ලබන ඉල්ලීම අසාධාරණ බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

<u>(ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා, ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා සහ ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)</u>

ලැන්දෑව හන්දියේ ඇති මහාබෝධි සමාගම සතු ඉඩම සභාවට අත්පත්කර ගැනීමට යෝජනා වූ බවත් ඒ සඳහා මහාබෝධි සමාගම විසින් වාචික එකඟතාවය පළ කලද, මේ වන විට එම ඉඩම මහාබෝධි සමාගම විසින් වෙනත් පාර්ශවයක් වෙත ලබා දී ඇති බැවින් එම ඉඩමේ සිදුකරනු ලබන කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා සභාවේ අනුමැතිය ලබා නොදෙන ලෙස ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

බල ප්‍රදේශය තුළ වීදි පහන් සවි කිරීමට අදාළ විස්තර ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ඉල්ලීම් කරන ලදී.

යූ.පී. පියදාස මහතා ලක්වී ඇති අපහසුතාවය පිළිබඳව සහ බොකරමුල්ලගොඩ හන්දියේ අනවසර ඉදිකිරීමක් සිදුකරනු ලබන බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**<u>මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු</u>**

01. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2021-10-15 වන සිකුරාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.